අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# ක්‍රිස්තියානි ධර්මය

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# 1.0 විෂය හැඳින්වීම.

දහමින් තොරව සදාචාරසම්පන්න සමාජයක් කිසිසේත් බලාපොරොත්තු විය නොහැකිය. දහම් අවබෝධය අත්‍යවශ්‍ය කරුණක් වන්නේ එහෙයිනි. එබඳු ආගමික අවබෝධයක් සහිත ජීවිතය ඉතාමත් අගනේය. එමගින් නිතැතින්ම සදාචාරසම්පන්න සමාජයක් ද බිහි වේ.

විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ මෙතෙක් විෂයපාදකව ගොඩ නැගූ විෂයමාලා එම දර්ශනයෙන් මිදී නිපුණතා පාදක විෂයමාලා දර්ශනයක් සහිතව ගොඩනගා ඇත. ඒ අනුව කිතුනුවකු තම ධර්මය මගින් කවර ආගමික නිපුණතා තම ජීවිතයට එක් කර ගත යුතු දැයි මනාව හඳුනාගත යුතුව ඇත. ඒ ඒ නිපුණතා සංවර්ධනයට අදාළ කර ගත හැකි විෂය සන්ධාරය හඳුනාගෙන ඇති ආකාරය අවධානයට යොමු විය යුතුය. එයට උචිත ඉගෙනුම් ක්‍රමෝපාය සහතික කරන පංති කාමර ක්‍රියාවලියක් ද හඳුන්වා දී තිබේ.

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වාම එකම තේමාවක් හෝ තේමා සමූහයක් පාදක කොටගෙන 6 වන ශ්‍රේණියේ දී ලිහිල් හැඳින්වීම්වලට සීමා කොට 11 වන ශ්‍රේණිය වන විට තේමාවලින් ඉගැන්වෙන දේ පිළිබඳ යම්කිසි පරිණතභාවයක් කරා ගෙන එන ආකාරයෙන් විෂය නිර්දේශය සකස් කර ඇත්තේ ද එහෙයිනි.

අප දන්නා තරමින් 11 වන ශ්‍රේණියේ ඉගෙනුම අවසන් කිරීමත් සමඟ විධිමත් ලෙස බොහෝ සිසුන්ගේ ආගම ඉගෙනීම ද අවසන් වෙයි. එහෙත් උසස් පෙළ දක්වා ආගම විෂය යටතේ ක්‍රිස්තියානි ධර්මය හා ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ඉගෙනීමට අවස්ථාව ලබා ගන්නා සිසුන් හට වඩා පරිණත වූ තත්ත්වයක් හා ජීවිත පුහුණුවක් කරා යොමු කරන්නට හැකි වන ආකාරයෙන් සකස් වූ විෂය නිර්දේශයක් ඔස්සේ මූලික වශයෙන් දේව වචනය,සහා ඉතිහාසය , සහා ඉගැන්වීම් ආදිය හා වෙනත් බොහෝ දේ පිළිබඳ ඉතා ගැඹුරු හා පුළුල් නිපුණතාවක් ලබා ගැනීමට අවකාශය ලැබේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනය හෝ ඉන් ඔබ්බට ගමන් කරන සිසුවා මුහුණ දෙන ජීවිත අභියෝග ඉදිරියේ මනා පරිණතභාවයකින් කටයුතු කරන්නට එය රුකුලක් වනු ඇත.

ජීවිතයේ එක් අදියරක් අවසන් කොට තවත් අදියරකට පිය එසවීමට බලා සිටින මෙම සිසු දරුවනට දහම ජීවිතයට ඒකාබද්ධ කර ගැනීමට සහාය වීමේ අපේක්ෂාවෙන් මෙම විෂය නිර්දේශය සැකසී තිබේ. ක්‍රිස්තියානි ධර්මය විෂය සඳහා වන නව විෂය නිර්දේශය පැරණි විෂය නිර්දේශයෙන් වෙනස් වන ආකාරය මෙසේ දැක්විය හැකි ය.

## පැරණි විෂය නිර්දේශය:

(1) ශුද්ධ බයිබලීය පොදු හැඳින්වීම
(2) ශුද්ධ බයිබලීය ප්‍රාග් ඉතිහාසය හැදෑරීම
(3) ආදි පියවරුන් පිළිබඳ අධ්‍යයනය

(4) නික්මයාමේ සිද්ධිය පිළිබඳ අධ්‍යයනය කිරීම
(5) දිවැසිවරුන් පිළිබඳ ශුද්ධ බයිබලීය හැදෑරීම
(6) ශුභාරංචි සතර ගැඹුරින් හැදෑරීම
(7) අපොස්තුළුවරුන්ගේ ක්‍රියාපොත හැදින්වීම
(8) දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නැමැති ප්‍රකාශනය හැදෑරීම
(9) ශුද්ධවූ පාවුළුතුමාගේ සන්දේශ හැදෑරීම
(10) විශ්ව සභා ඉතිහාසය අධ්‍යයනය කිරීම
(11) ශ්‍රී ලංකා සභා ඉතිහාසය අධ්‍යයනය කිරීම

## නව විෂය නිර්දේශය :

(1) ශුද්ධ ලියවිල්ල සකස් වී ඇති ආකාරය හා එය බිහිවීමට සාධක වූ භූගෝලීය පසුබිම
(2) පංච පුස්තකයේ ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික කරුණු
(3) නික්මයාමේ සිද්ධිය තුළින් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය
(4) ගිවිසුම් ජීවිතයේ අරුත
(5) දිවැසිවරුන්ගේ කැඳවීම හා මූලික ඉගැන්වීම්
(6) ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ වූ දේශපාලන සමාජය පසුබිම හා සමාජ කණ්ඩායම්
(7) සමදර්ශක සුවිශේෂවල සමාන අසමානකම් හා සැකැස්ම
(8) මාක් තුමාගේ සුවිශේෂය තුළ පාස්කු අභිරහස
(9) ජුවාම් තුමාගේ සුවිශේෂයේ අන්තර්ගතවන පාස්කු අභිරහසේ විශේෂ තේමා
(10) සභාවේ ආරම්භක අවධිය හා විකාශනය පිළිබඳ කරුණු
(11) යුරෝපය තුළ සභාව බෙදීයාම
(12) ලෝකයට සභාවේ දායකත්වය
(13) ශ්‍රී ලංකා කතෝලික සභාවේ ඉතිහාසය
(14) මිනිසා හා සමාජය පිළිබඳවද වත්මන් සමාජ ගැටළු පිළිබඳව ද කිතුනු සභා එකමුතුව හා බැඳී සභා ඉගැන්වීම්

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

1. ශුද්ධ ලියවිල්ල සකස් වී ඇති ආකාරය තුළින් එය බිහි වූ භූගෝලීය හා ඓතිහාසික පසුබිම සොයා බලා එය තම ජීවිත පසුබිම් කර ගැනීමට ඉඩ සැලසීම.

2. පංච පුස්තකය අධ්‍යයනය කිරීම තුළින් දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරත්වය අවබෝධ කර ගෙන එය අපගේ ජීවිතය තුළ ක්‍රියාත්මක කිරීමට යොමු කිරීම.

3. දෙවියන් වහන්සේ හා ජනතාව අතර සම්බන්ධය ගිවිසුම හා දිවැසිවරුන් මගින් ප්‍රකාශ වූ ආකාරය අවබෝධ කරගෙන දේව ක්‍රියාකාරත්වයට අවනත කරවීම

4. සුභාරංචිය අධ්‍යයනය කිරීම තුළින් වඩාත් පරිණත ලෙස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට පක්ෂපාතී ජීවිතයක් ගත කිරීමට යොමු කිරීම.

5. සුවිශේෂ තුළින් ප්‍රකාශ වන පාස්කු අභිරහස සිය ජීවිතයට අදාළ කර ගැනීමට හුරු කරවීම.

6. සභාවේ ආරම්භය හා ව්‍යාප්තිය අධ්‍යයනය කිරීම තුළින් වර්තමාන සභාව තුළ ක්‍රියාකාරී වීමට යොමු කිරීම.

7. සභාවේ උන්නතිය වෙනුවෙන් විශ්වාසය තුළින් අභියෝග ජය ගැනීමට මග පෙන්වීම.

8. ශ්‍රී ලංකා සභා ඉතිහාසය හදාරා තම ජීවිතයෙන් දේශීය කිතුනු අනන්‍යතාවයට සාක්ෂි දැරීමට හුරු කරවීම.

9. දේව ප්‍රසාද නිධාන අත්කර ගැනීම තුළින් නව කිතුනු දැක්මක් කරා ගමන් කිරීමට සැලැස්වීම.

10. මිනිසා සමාජය හා පරිසරය පිළිබඳ කිතුනු චින්තනය තුළ කිතුනු වගකීම ඉටු කරමින් මානව සහජීවනය ගොඩ නගා ගැනීමට සහය කරවීම.

11. බහු ආගමික සමාජයක් තුළ වගකීමෙන් ක්‍රියා කිරීමෙන් සමයාන්තර සබඳතා වර්ධනය කර ගැනීමට මග පෙන්වීම.

**විෂය නිර්දේශය පාසල් වාර වශයෙන්**
**බෙදා ගැනීමට යෝජිත සැලැස්ම**

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 12 | 1 | 1.1 - 2.1 | 90 |
| | 2 | 2.2 - 4.1 | 110 |
| | 3 | 4.2 - 5.2 | 100 |
| 13 | 1 | 6.1 - 7.1 | 120 |
| | 2 | 7.2 - 8.3 | 100 |
| | 3 | 9.1 - 10.3 | 80 |

## 3.1 - 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 ශුද්ධ ලියවිල්ල නිසිලෙස අවබෝධ කර ගැනීම පිණිස එය තම ජීවිත පසුබිම කර ගනියි. | 1.1 ශුද්ධ ලියවිල්ල සකස් වී ඇති ආකාරය සොයා බලයි. | • නාම විග්‍රහය<br>• අන්තර්ගතය<br>• වර්ගීකරණය<br>• වාචික සම්ප්‍රදාය<br>• ලේඛනගත කිරීම<br>• කතෘත්වය<br>• දේවානුභාවය<br>• සම්මත ග්‍රන්ථ | 26 |
| | 1.2 ශුද්ධ ලියවිල්ල බිහිවීමට සාධක වූ භූගෝලීය හා ඓතිහාසික පසුබිම සොයා බලයි. | • භූගෝලීය පසුබිම<br>• ඓතිහාසික පසුබිම<br>• නික්මයාම<br>• ජන නායකයෝ<br>• රජවරු<br>• රාජ්‍ය දෙකඩවීම<br>• විප්‍රවාසය<br>• අපර විප්‍රවාසී යුගය | 34 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 2.0 ශුද්ධ ලියවිල්ලේ මුල් ග්‍රන්ථ පහ තුළ පිළිබිඹු වන දේව සැලැස්ම මගින් අප ජීවිතවල දේව සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඉඩ දෙයි. | 2.1 පංච පුස්තකයේ ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික කරුණු අධ්‍යයනය කරයි. | • පංච පුස්තකයේ සැකසුම JEDP සම්ප්‍රදායන්ට අනුව<br>• මැවීමේ කථා (උත්පත්ති 1 - 3)<br>• ආදිපීතෘවරු<br>  • ආබ්‍රහම්<br>  • ඊසාක්<br>  • ජාකොබ්<br>(කැඳවීම, ගිවිසුම, ඇදහිල්ල යන කරුණු) | 30 |
| | 2.2 නික්මයාමේ සිද්ධිය මගින් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි. | • මෝසස් කැඳවීම<br>• වසංගත දහය<br>• යුදා පාස්කුව<br>• රතු මුහුද තරණය<br>• පාළුකරයේ ගමන | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 3.0 දෙවියන් වහන්සේ තම ජනතාව සමඟ සම්බන්ධ වූ ආකාරය හඳුනාගෙන දේව ක්‍රියාකාරිත්වයට අවනත වෙයි. | 3.1 දෙවියන් වහන්සේ හා ජනතාව අතර සම්බන්ධය ගිවිසුම මගින් ප්‍රකාශ වූ ආකාරය ඉගෙන ගනියි. | • සීනායි ගිවිසුම (නික්මයාම 19 - 24)<br>• ගිවිසුම හා ඊශ්‍රායෙල් ජනතාව. | 20 |
| | 3.2 දිවැසිවරුන්ගේ කැඳවීම හා මූලික ඉගැන්වීම් විමර්ශනය කරයි. | • හැඳින්වීම<br>• තේමා<br>• කැඳවීම (යෙසායා, ජෙරමියා , එසකියෙල්)<br>• මෙසියානු සංකල්පය (යෙසායා, මීකා)<br>• දුක් විඳින සේවකයා (යෙසායා)<br>• බලාපොරොත්තුව<br>• සමාජ සාධාරණත්වය (ආමොස්)<br>• ගිවිසුම් | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- |
| 4.0 සුභාරංචිය අධ්‍යයනය කිරීම මගින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට පක්ෂපාත ජීවිතයක් ගත කරයි. | 4.1 ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ වූ දේශපාලන සමාජීය පසුබිම හා සමාජ කණ්ඩායම් පිළිබඳ හදාරයි. | • දේශපාලන පසුබිම<br>• සමාජීය පසුබිම<br>• ආගමික කණ්ඩායම්<br>• පරිසිවරු,<br>• සද්දුසිවරු.<br>• හෙරෝදිවරු<br>• සමරිතානුවරු<br>• එසේනිවරු<br>• අන්‍ය ජාතිකවරු | 20 |
| | 4.2 සමදර්ශක සුවිශේෂවල සමාන අසමානකම් හා සැකැස්ම පැහැදිලි කරයි. | • පරමාර්ථ<br>• කර්තෘත්වය හා කාලය<br>• සමදර්ශක ගැටලුව<br>• කන්ද උඩ දේශනාව<br>• දේව රාජ්‍යය පිළිබඳ තේමාව<br>• උපමා<br>• ප්‍රාතිහාර්යයන් | 34 |
| | 4.3 ජුවාම් සුවිශේෂය පිළිබඳ විශේෂ අධ්‍යයනයක යෙදෙයි. | • මූලාශ්‍ර<br>• කතෘත්වය<br>• කාලය<br>• පරමාර්ථ<br>• ලකුණු | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 ගැලවීමේ මූලික සිද්ධිය වූ පාස්කු අභිරහස පිළිබඳ හඳාරා එය ජීවිතයෙන් ප්‍රකාශ කරයි. | 5.1 ශුද්ධ වූ මාක් තුමාගේ සුවිශේෂය තුළ පාස්කු අභිරහස පිළිබඳ අධ්‍යයනයක යෙදෙයි. | • ස්වාමීන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය පිළිබඳ පෙර ප්‍රකාශනය<br>• මාර්ක් සුවිශේෂයේ පාස්කු අභිරහස අධ්‍යයනය කිරීම. | 20 |
| | 5.2 ජුවාම් තුමාගේ සුවිශේෂයේ අන්තර්ගත වන පාස්කු අභිරහසේ විශේෂ තේමා අධ්‍යයනය කරයි. | • පාද දෝවනය<br>• උත්තම පූජක යැදුම<br>• නඩු තීන්දුව<br>• උත්ථානය<br>• ශුද්ධාත්මයාණෝ | 30 |

## 3.2 - 13 වන ශ්‍රේණිය

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 යුගයෙන් යුගයට වූ සභා ව්‍යාප්තිය හඳුනා ගනිමින් වර්තමාන සභාවේ උන්නතිය උදෙසා කැපවෙයි. | 6.1 සභාවේ ආරම්භක අවධිය පිළිබඳ කරුණු හදාරයි. | • ශුද්ධ සභාවේ ආරම්භක අවධිය<br>• ශුද්ධාත්මාගමනය<br>• ජුදා පසුබිම තුළ කිතුනු සසුන<br>• මුල් සභාවේ විශේෂ ලක්ෂණ<br>• ජෙරුසලෙම් මන්ත්‍රණ සභාව<br>• ශාන්ත ස්තේවන්තුමා හා සභා ව්‍යාප්තිය<br>• පාවුළුතුමාගේ ධර්මදූත ගමන්<br>• පාවුළුතුමාගේ මූලික ඉගැන්වීම්<br>• දේව අනුග්‍රහය<br>• නායකත්වය හා බැහැපත්කම<br>• උත්ථානය හා දෙවන පැමිණීම<br>• පවුල් දිවිය<br>• සහෝදරත්වය හා එකමුතුකම<br>• ශුද්ධාත්ම දීමනා හා ඵල | 50 |
| | 6.2 සභා පිය යුගය තුළ කිතුනු සභාවේ වර්ධනය හදාරයි. | • ප්‍රධාන මන්ත්‍රණ සභා<br>• නයිසීන<br>• කොන්ස්තන්තිනෝපල්<br>• එපීස<br>• වැල්සඩන් | 20 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 6.3 යුරෝපය තුළ සභාව මුල් බැසගත් ආකාරය පිළිබඳ ඓතිහාසික කරුණු හදාරයි. | • සභා පියවරු<br>• ජස්ටින් තුමා<br>• අතනාසියස් තුමා<br>• ජෙරම් තුමා<br>• ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා<br>• ඔගස්ටින් තුමා<br>• ඔරිගන් තුමා<br>• ටර්ටුලියන් තුමා<br>• යුරෝපයේ කිතුනු ව්‍යාප්තිය (5 - 9 ශතවර්ෂ)<br>• මධ්‍යතන යුගය (10 - 12 ශතවර්ෂ) | 20 |
| 7.0 යුරෝපය තුළ සභාව මුහුණ දුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය හදාරමින් දේව විශ්වාසය තහවුරු කර ගනියි. | 7.1 යුරෝපයේ සභාව බෙදීයාම පිළිබඳ කරුණු හදාරයි. | • සභාව බෙදී යාමේ පසුබිම<br>• මාටින් ලූතර්ගේ විප්ලවය<br>• කැල්වින් සහ ස්වින්ලිං<br>• අටවන හෙන්රි රජතුමා | 30 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- |
| | 7.2 ලෞකිකවාදය සැලකීම හා සභා ක්‍රියාකාරිත්වය විස්තර කරයි. | • පුනරුදය හා සභා ප්‍රතිසංස්කරණය (1500 - 1750)<br>• නූතන යුගය (1750 සිට) | 20 |
| | 7.3 ලෝකයට සභාවේ දායකත්වය පැහැදිලි කොටගෙන ජනතාවගේ උන්නතිය සඳහා කැපවෙයි. | • අධ්‍යාපනය<br>• විද්‍යාව හා තාක්ෂණය<br>• කලාව | 10 |
| 8.0 ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය හදාරා ලාංකේය කිතුනු අනන්‍යතාවට සාක්ෂි දරයි. | 8.1 යුරෝපීයයන් යටතේ ශ්‍රී ලංකාවේ සභාව ආරම්භය හා විකාශය අධ්‍යයනය කරයි. | • පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය<br>• පෘතුගීසි යුගය<br>• ලන්දේසි යුගය<br>• බ්‍රිතාන්‍ය යුගය | 30 |
| | 8.2 නිදහස් ශ්‍රී ලංකාවක් තුළ සභාව පිළිබඳ කරුණු හදාරයි. | • නිදහසින් පසු සභාව මුහුණ දුන් ගැටලු<br>• දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ බලපෑම්<br>• වත්මන් සමාජය තුළ ලාංකේය සභාව | 30 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 8.3 ශ්‍රී ලාංකේය සමාජයට සභාවෙන් වූ දායකත්වය හඳාරයි. | • අධ්‍යාපනය<br>• සංස්කෘතිය හා කලාව<br>• සමාජ සේවාව | 10 |
| 9.0 කිතුනු ජනවන්දනාවට සහභාගි වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි. | 9.1 කිතුනු විශ්වාසය ගොඩනැගීමට ජනවන්දනාව දායක වූ ආකාරය සොයා බලයි. | • මුල් කිතුනු සභාව හා ජනවන්දනාව<br>• පෙරදිග සභාවේ ජනවන්දනා ක්‍රම<br>• බටහිර සභාවේ ජනවන්දනා ක්‍රම | 12 |
| | 9.2 කිතුනු ජීවිතය තුළ ප්‍රසාද නිධාන ලබා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | • ප්‍රසාද නිධාන ක්‍රිස්තු කේන්ද්‍රීය බව<br>• ප්‍රසාද ස්නාපනීය කැඳවීම.<br>• ස්වාමීන් වහන්සේගේ යාගික බොදුන හා සහජීවනය | 20 |
| | 9.3 නව කිතුනු දැක්මක් සඳහා ශුධාත්ම ක්‍රියාකාරීත්වයේ අවශ්‍යතාව විස්තර කරයි. | • ලෝකය තුළ ශුධාත්ම ක්‍රියාකාරීත්වය<br>• ශුද්ධාත්මයන් හා සාක්ෂි දැරීම. | 12 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 10.0 පවතින සමාජ සංවර්ධනය තුළ මානව සහජීවනයෙන් කටයුතු කරයි. | 10.1 මිනිසා ගැන හා සමාජය පිළිබඳ කිතුනු චින්තනය පැහැදිලි කරයි. | • මිනිස් බවේ ගරුත්වය<br>• කාන්තාවන් පිළිබඳ කිතුනු චින්තනය<br>• මිනිසාගේ සමාජ ජීවිතය<br>• මානව සංවර්ධනය හා කිතුනු සහභාගීත්වය | 16 |
| | 10.2 වත්මන් සමාජ ගැටලු පිළිබඳව කිතුනු වගකීම ගෙනහැර දක්වයි. | • ගැටුම් නිරාකරණය හා සාමය නගාලීම<br>• පරිසරය සුරැකීමේ කිතුනු වගකීම | 08 |
| | 10.3 කිතුනු එකමුතුව හා විවිධ ආගම් සමඟ සහජීවනය සඳහා වඩාත් වගකීමකින් ක්‍රියා කරයි. | • ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා<br>• කිතුනු සභා සංවාදය<br>• විවිධ ආගම් සමඟ සහජීවනය | 12 |

# 4.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

දෙවි - මිනිස් සබඳතාවය තුළ නිවැරදි අධ්‍යාත්මයක් ගොඩනගා ගනිමින් පරිනත බවක් කරා ගමන් කිරීමට දහම නිවැරදි ලෙස අවබෝධ කරගැනීම හා ඒ තුළින් ලැබෙන ජීවිත පන්නරය විශ්වාසයේ අත්දැකීමක් බවට පත්කර ගැනීම කිතුනු ජීවිතය තුළ ප්‍රමුඛස්ථානයක් ලබා ගනියි. මෙය එකිනෙකාගේ පුද්ගලික ජීවිත අත්දැකීමක් බවට පත්කර ගනිමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස දිවිගෙවන්නට අවැසි පසුබිම සැකසීම ශිෂ්‍යයා ලබන්නාවූ ආගමික අධ්‍යාපනයේ සැබෑ පරමාර්ථයයි.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමට නම් පන්ති කාමරය තුළ ලබන දැනුමට සීමා නොවී අභියෝග ජයගනිමින් විවිධ වූ යහපත් ජීවිත පුරුදු හා නිපුණතා කරා සිසුන් මෙහෙයවන්නට අවශ්‍ය වන්නාවූ ශක්තියෙන් සන්නද්ධ වන්නට විවිධ ඉගැන්වීම් ක්‍රමෝපාය ප්‍රයෝජනයට ගැනීම කාලෝචිතය.

උසස් පෙළ අධ්‍යයන කටයුතු නිමවා වැඩ ලෝකය කරා ගමන් කරන ශිෂ්‍යයා හට නිවැරදි මග පෙන්වීම තුළ සුදුසු රැකියා අවස්ථා තෝරා ගැනීමට ද, තම යුතුකම් නිවැරදි ලෙස ඉටු කරන සාරධර්ම පිරිපුන් පුරවැසියකුගෙන් අධ්‍යාපනයක් ලැබෙන සේ සකස් වී ඇති මෙම විෂය නිර්දේශය අධ්‍යයනය කිරීමට වඩා පහසුවන ලෙස මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගැනීමට දරුවන් මෙහෙයවීම ගුරුවරයා සතු මූලික වගකීමක් ද වෙයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට පහත සඳහන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගැනීම කාලෝචිතය.

- සංකල්ප සිතියම්
- සම්මුඛ පරීක්ෂණ හා සාකච්ඡා
- ව්‍යාපෘති හා සැලසුම් නිර්මාණ
- ප්‍රදර්ශන සංවිධානය කිරීම
- විවාද
- සාකච්ඡා
- සම්මන්ත්‍රණ
- ක්ෂණික කථා
- භූමිකා රංගන
- සාහිත්‍යමය වටිනාකමකින් යුත් ස්වනිර්මාණ ඉදිරිපත් කිරීම
- ක්ෂේත්‍ර චාරිකා හා සමීක්ෂණ
- නේවාසික ධර්ම විවේක හා ජනවන්දනාත්මක පිළිවෙත්
- සමාජ තලයට අවතීර්ණවීමට අවකාශය ලැබෙන ආකාරයේ ව්‍යාපෘති හා වැඩ සැලසුම්

# 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

- අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් පාසල් මට්ටමින් නේවාසික ධර්ම විවේකයක් සංවිධානය කර සිසුන්ට ක්‍රියාකාරීව ඊට සම්බන්ධ කරවීම.
- එක් පාසල් අධ්‍යයන වාරයක් තුළ අවම වශයෙන් එක් වතාවක්වත් දිව්‍ය පූජා මෙහෙයකට පන්තියක් වශයෙන් සිසුන් සහභාගි කරවීම.
- සිසුන්ගේ අධ්‍යාත්මික වර්ධනය උදෙසා හැකි හැමවිටම මීසම භාර පියතුමන්ගේ හා වෙනත් පැවිදිවරුන්ගේ සහය නොමදව ලබා ගැනීම.
- පාසල් මට්ටමින් සියලු සමිති සමාගම් ආරම්භ කර ඒවායේ සාමාජිකත්වය ලබාදීමෙන් සිසුන් තුළ යම් පිරිපුන් බවක් ඇති කිරීම.
- පාසල් සංස්කෘතිය හා බැඳි විවිධ මංගල්‍ය අර්ථවත් ලෙස සංවිධානය කිරීම, සැමරීම, හා ළමා රැළි, විෂය කඳවුරු ආදිය සංවිධානය කිරීම.
- කණ්ඩායම් ලෙස දේව වචනය කියවීම, අධ්‍යයනය කිරීම වැනි කටයුතුවලට සිසුන් යොමු කිරීම.
- පාසල තුළ ශිෂ්‍ය සුභසාධනය පිළිබඳ ධනාත්මක හැඟීම් ඇති කර අසරණයින්ට සහයවීමට ඔවුන් යොමු කිරීම.
- පාසල තුළ සහජීවනය හා සහෝදරත්වය වැඩි වර්ධනය කර ගනිමින් යහපත් පරිසරයක් ගොඩනැගීමට නිතර කැපවී කටයුතු කිරීම.
- දයා සේවාවල නිරත වන සමිති සමාගම්වලට සහය දැක්වීම හා ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම.

# 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් - ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය.

13 වන ශ්‍රේණිය අවසානයේදී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිතය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.